# මහජනතාව වෙත
# කරනු ලබන නිවේදනයයි

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

# අනවසර තැන්පතු රැස්කිරීම

## ආර් ඩී මීඩියා අර්නිං හබ් (පීවීටී) එල්ටීඩී
## (PV 00222075)

2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතෙහි 42 වන වගන්තිය යටතේ සිදු කරන ලද විමර්ශනයකින් අනතුරුව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2025.11.17 දින;

(i) අංක 294, හයිලෙවල් පාර, මාකුඹුර, කොට්ටාව, පන්නිපිටිය යන ස්ථානයේ ලියාපදිංචි ආර් ඩී මීඩියා අර්නිං හබ් (පීවීටී) එල්ටීඩී (PV 00222075) යන ආයතනය 2020 ජුනි සිට 2021 අප්‍රේල් දක්වා කාලය තුළ;

(ii) එම ආයතනයේ හිටපු අධ්‍යක්ෂවරයෙකු වූ, අංක 06/08, බලපොකුණ පාර, කළුබෝවිල, දෙහිවල යන ලිපිනයෙහි පදිංචි ඉහළ කිහිඹිය පතිරණගේ රුවින්දි තීක්ෂණා (936641440V) යන අය 2020 ජුනි සිට 2021 ජනවාරි දක්වා කාලය තුළ සහ;

(iii) එම ආයතනයේ අධ්‍යක්ෂවරයෙකු වන අංක 9 සී, ආනන්ද බාලිකා පාර, පිටකෝට්ටේ යන ලිපිනයෙහි පදිංචි දසනායක මුදියන්සේලාගේ එරංග මනෝජ් දසනායක (942963963V) යන අය 2021 ජනවාරි සිට 2021 අප්‍රේල් දක්වා කාලය තුළ

එකී පනතෙහි ප්‍රතිපාදන උල්ලංඝනය කරමින් තැන්පතු භාරගත් බවට නිශ්චය කර ඇති බව මුදල් ව්‍යාපාර පනතෙහි 42(10) වන වගන්තිය යටතේ මහජන සුභසිද්ධිය පිණිස මහජනයා වෙත දැනුම් දීම සඳහා මෙම දැන්වීම පළකරනු ලැබේ.

ඒ අනුව, ආර් ඩී මීඩියා අර්නිං හබ් (පීවීටී) එල්ටීඩී යන ආයතනයට, ඉහළ කිහිඹිය පතිරණගේ රුවින්දි තීක්ෂණා යන අයට සහ  දසනායක මුදියන්සේලාගේ එරංග මනෝජ් දසනායක යන අයට;

(i) ඇප තැන්පතු, ආයෝජන ගිවිසුම් නිකුත් කිරීම හරහා හෝ වෙනත් කිසිදු ආකාරයකින් තැන්පතු භාර නොගන්නා ලෙස; සහ

(ii) එම සමාගමේ පවතින සියලු තැන්පතු වගකීම් පියවීමට පියවර ගත යුතු බවට

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් තවදුරටත් විධාන කර ඇත.


**ශ්‍රී ලංකා මහ බැංකුව**

**අංක 30, ජනාධිපති මාවත, කොළඹ 01**

☎ 011-2477504 | 011-2477738 | @ dsnbfi@cbsl.lk | http://www.cbsl.gov.lk